2020 Dinamina and Silumina -Udayanga -info@udayanga.com -0762599168







# මිග් ගනුදෙනුවේ ඇත්ත කතාව

රුසියාවේ හිටපු තානාපති උදයංග වීරතුංග පසුගිය යහපාලන කාලය පුරා කතාබහට ලක් වූ අයෙකි. ඊට ඈඳුණු මිග් යානා ගනුදෙනුව ද මෙරට ජනතාවට නොරහසකි. මාධ්‍යයේ ද, පාර්ලිමේන්තුවේ ද, කැබිනට්ටුවේ ද කතා වූයේ උදයංග ගැනය. මෙයට හේතුව සරලව කිව හොත් කෙක්කෙන් බැරි වූ දේ කොක්කෙන් හරි කිරීමට ඔවුන්ට අවශ්‍ය වූ නිසාය.

මිග් යානා ගනුදෙනුව සිදු වූයේ 2006 වසරේදීය. 2000 වසරේ දී මෙරට රජය මිල දී ගත් යානාවලට වඩා වැඩි මුදලක් ලබා දී මිග් යානා හතක් මිල දී ගනිමින් ලංකා රජයට පාඩු කළේ යැයි මුලින්ම ඇඟිල්ල දිගු වන්නේ හිටපු ආරක්ෂක ලේකම් වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙතය. සන්ඬේ ලීඩර් පුවත්පත ලිපියක් පළ කරමින් මිග් ගනුදෙනුව පිළිබඳව ගෝඨාභය රාජපක්ෂ මහතා වැරදිකරු කිරීමට උත්සාහ දැරුවත් එම උත්සාහය පල රහිත වන්නේ මිග් ගනුදෙනුව මෙරට සිදු වූ විනිවිද ගනුදෙනුවක් ලෙසට රාජපක්ෂ මහතා විසින් අධිකරණයේදී ඔප්පු කිරීම හේතුවෙනි. ඒ විතරක් නොව අදාළ පුවත්පතට රුපියල් මිලියන සීයක වන්දියක් ගෙවීමට ද අධිකරණය නියෝග කරන්නේය. ගල්කිස්ස අධිකරණය මේ නියෝගය ලබා දෙන්නේ ද යහපාලන රජය පත් වීමෙන් පසුව (2015) වීම තවත් විශේෂ සිද්ධියක් වන්නේය.

යහපාලන ආණ්ඩුව බලයට පත් වීමෙන් පසුව ගෝඨාභය රාජපක්ෂ මහතා කොටු කර ගැනීමේ මෙහෙයුම යළි කරළියට එන්නේය. ඊට තෝරා ගන්නේ උදයංග වීරතුංග නම් රුසියාවේ හිටපු තානාපතිවරයාය. ඔහු රාජපක්ෂ මහතාගේ පුංචි අම්මාගේ පුතාය. මැදමුලන විද්‍යාලයෙන් හා කොළඹ නාලන්දා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබන වීරතුංග මහතා රුසියාවට පා තබන්නේ 1985 වසරේදීය. අධ්‍යාපනය නිමා කිරීමෙන් පසුව ව්‍යාපාර කටයුතුවල නිරත වන වීරතුංග මහතා විදේශ අමාත්‍ය ලක්ෂ්මන් කදිරගාමර් මහතාගේ සමයේදී ශ්‍රී ලංකා ඔනරලි කවුන්සල්වරයා බවට පත්වීම් ලබන්නේ එතෙක් පැවැති තානාපති අඩුපාඩුවක් සම්පූර්ණ කරමින්ය. 1992 යුක්රේන් ප්‍රාන්ත රාජ්‍යයක් ලෙස සිදු වූ පරිවර්තනයෙන් පසු ඔහු සතු භාෂා නිපුණතාවයත්, දීර්ඝ කාලීන පදිංචියත් හේතු කොට තානාපතිවරයකු ලෙස 2006 ජූලි 17 දින සිට පත්වන්නේය. මිග් යානා ගනුදෙනුව සිදු වීමට පෙර ශ්‍රී ලංකා රජය ඇන්ටනෝ 32 වර්ගයේ ගුවන් යානා 08ක් මිල දී ගන්නේ ද යුක්රේන් රාජ්‍යයෙනි. එහිදී ද ශ්‍රී ලංකා රජයට පහසුකම් සපයන්නා ලෙස ක්‍රියා කර ඇත්තේ වීරතුංග මහතාය. එම දීර්ඝ කාලීන සබඳකම් හා හමුදාවන් අතර සම්බන්ධීකරණය හේතුවෙන් දේශ හිතෛෂී මිතුරකු ලෙස හෙතෙම ශ්‍රී ලංකා ගුවන් හමුදාපතිවරයාට සහාය වන්නේය. ඒ තානාපතිවරයකු ලෙස නොවන බව හෙතෙම සඳහන් කරන්නේය.

වීරතුංග මහතා තානාපති ලෙස වැඩ බාර ගැනීමට පෙර මිග් ගනුදෙනුවට ශ්‍රී ලංකා රජය අස්සන් කර ඇති බවත්, ශ්‍රී ලාංකික පුරවැසියකු ලෙස තමන් යුක්රේන් රාජ්‍යයේ සබඳකම් මත අදාළ ගනුදෙනුවේ පහසුකම් සපයන්නා ලෙස පමණක් කටයුතු කළ බවත් වීරතුංග මහතා පසුගියදා දිවුරුම් පිට ප්‍රකාශ කළේ දේශපාලන පළි ගැනීම් පිළිබඳ විමර්ශන ජනාධිපති කොමිසම හමුවේදීය. රටට හිතැතිව කටයුතු කළ තමන් දේශපාලන ඉලක්කයක් කර ගනිමින් යහපාලන ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලය ක්‍රියා කළ ආකාරයත්, කැබිනට් මණ්ඩලය පත් කළ දූෂණ විරෝධී කමිටුව දේශපාලන පළිගැනීම් කළ ආකාරයත් හෙතෙම අනාවරණය කළේය.

ශ්‍රී ලංකා රජය 2000දී මිල දී ගත් මිග් ගුවන් යානා සහ 2006 දී මිල දී ගත් ගුවන් යානා 7 අතර වෙනස ඔහු මනාව කොමිසමට සාක්ෂි සහිතව ඉදිරිපත් කළේය.

මිග් ගනුදෙනුව හේතුවෙන් තමාව කොටු කර ගැනීමට ගත් උත්සාහය දේශපාලන පළි ගැනීමක් පමණක් බව ඔප්පු කිරීමට හිටපු අගමැතිවරයා පමණක් නොව හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ද කොමිසමට කැඳවීමට හෙතෙම තීරණය කළේය.

දේශපාලන පළි ගැනීමක් කළ බවට සනාථ කිරීමට මිග් ගනුදෙනුව සිදු වූ අයුරු හා විමර්ශන කළ අයුරු මෙසේ කොමිසමට සඳහන් කර සිටියේය.

## ගල්කිස්ස අධිකරණයෙන් දියාරු වූ පැමිණිල්ල නැවතත් කරළියට

"ශ්‍රී ලංකා ගුවන් හමුදාවට මිග් ගුවන් යානා මිල දී ගැනීමේදී මූල්‍යමය අක්‍රමිකතාවක් සිදු වී ඇති බවට මාධ්‍යවේදී ඉක්බාල් අතාස් යන අය කර ඇති පැමිණිල්ලක් අනුව 2015 මාර්තු 26 දින මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනු කළා. පසුව 2016/10/20 දින අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 63(1) (අ) උප වගන්තිය යටතේ වරෙන්තු නිකුත් කළා. මෙලෙස මට එරෙහිව වරෙන්තු ලබා ගැනීම බොරු සාක්ෂි ඉදිරිපත් කර සම්පූර්ණයෙන් අධිකරණය නොමඟ යවා කටයුතු කිරීමක් වෙනවා. අසත්‍ය කරුණු කොටුව මහේස්ත්‍රාත්වරයාට ඉදිරිපත් කර තිබුණා.

ශ්‍රී ලංකා රජය 2000 වර්ෂයේ මැයි මාසයේ දී ශ්‍රී ලංකා ගුවන් හමුදාවට මිග් 27 ගුවන් යානා 04 ක් සිංගප්පූරු සමාගමක් වන D.S ALLIANCE නමැති සමාගම මඟින් ඇමරිකානු ඩොලර් මිලියන 1.75 බැගින් ද තවත් යානා 03 ක් ඇමරිකානු ඩොලර් මිලියන 1.60 බැගින් ද මිල දී ගන්නවා. එම ගුවන් යානා 1982, 1983 හා 1984 වසරවල නිෂ්පාදිත ඒවා බව පැමිණිලි කර ඇත. 2006 වසරේ දී නැවතත් 1980 හා 1983 වසරවල නිෂ්පාදිත එම වර්ගයේ යානා 04ක් ශ්‍රී ලංකා ගුවන් හමුදාව මඟින් ඇමරිකානු ඩොලර් මිලියන 2.462 බැගින් මිල දී ගෙන ඇති බවත්, ඒ අනුව එකම කාලයේ නිෂ්පාදිත යානා මිල දී ගැනීම සඳහා 2000 වසරේ ගෙවූ මිලට වඩා අධික මිලක් 2006 වසරේ දී ගෙවා ඇති බවත් සඳහන් කරමින් මෙම පැමිණිල්ල කර තිබුණා. අදාළ ගනුදෙනුව ශ්‍රී ලංකා රජය සහ යුක්රේන රජය අතර සිදුවන්නක් බව පෙන්වා දී තිබුණ ද 2006 වර්ෂයේදී සිදුවූ ගනුදෙනුවෙහිදී මුදල් ගෙවනු ලැබ ඇත්තේ එංගලන්තයේ (BELLIMISSA HOLDINGS LTD) බෙලිමීසා නමැති සමාගමක් වෙත බව මාධ්‍යවේදී ඉක්බාල් අතාස් විසින් දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයට 2015.03.05 දින පැමිණිල්ලෙන් සඳහන් කර තිබුණා."

## යහපාලන ආණ්ඩුවේ දෙවැනි පැමිණිල්ල

පසුව එම දූෂණ විරෝධී කමිටුවේ ක්ෂණික ප්‍රතිචාර කමිටු සම්බන්ධීකාරක ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක සහ එහි අධ්‍යක්ෂ ආනන්ද විජේපාල විසින් පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය වෙත පිටු 35 විස්තර වාර්තාවක් සහ පිටු 278 ඇමිණු ගොනුවක් ඉදිරිපත් කරමින් පැමිණිල්ල ඉදිරිපත් කර තිබුණා. මුදල් විශුද්ධිකරණ පනත යටතේ විමර්ශන කරන ලෙස නියෝජ්‍ය පොලිස්පති රවී වෛද්‍යාලංකාර මහතා වෙත ලිඛිතව පැමිණිලි කළා. වර්තමාන ජනාධිපතිවරයාගේ දේශපාලන ගමන නතර කිරීමේ මුල් පියවරක් ලෙස මා මේ පැමිණිල්ල දකිනවා. අසත්‍ය කරුණු පදනම් කර ගත් මෙම පැමිණිල්ල ද්වේෂ සහගතයි. මට අදාළ වන මෙම පැමිණිල්ල යහපාලන ආණ්ඩුව පත් වූ පසුව දූෂණ විරෝධී කමිටුව මගින් ඉදිරිපත් කළ 02 පැමිණිල්ල ලෙස සටහන් වෙනවා. ඒ වගේම යහපාලන ආණ්ඩුව විසින් අධිකරණයට ඉදිරිපත් කළ 05 පැමිණිල්ල වෙනවා. රනිල් වික්‍රමසිංහ මහතා 2015 ජනවාරි 21 ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවේ සටහන් වන විදිහට 15 දෙනකුට වත් නඩු පැවරීම අරමුණව තිබුණා. එම පහළොස් දෙනා අතර 11 වැනියා ලෙස මා සටහන් කිරීම දේශපාලන පළි ගැනීමක් ලෙස පෙන්වා දිය හැකියි. දූෂණ විරෝධී කමිටුවට පැමිණිලි ඉදිරිපත් කිරීමේ නීතිමය හැකියාවක් නොතිබූ බව මේ කොමිසමේ සාක්ෂි දුන් හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා පිළිගෙන තිබෙනවා. ඒ වගේම මාගේ පාස්පෝට් එක තහනම් කිරීම පිළිබඳව යහපාලන කැබිනට් මණ්ඩලයේ සාකච්ඡා කළ බව ද පිළිගන්නවා. මේ අනුව බලන කොට ස්වාමීනී මට එරෙහි පැමිණිල්ල සම්පූර්ණයෙන් නීතියට පටහැණි බව පේනවා.

ශ්‍රී ලංකා ගුවන් හමුදාව හා UKRINMASH නමැති සමාගම අතර 2006/07/26 දින SLAF/2006/07/AIR දරණ ගිවිසුම UKRINMASH සමාගමෙහි නියෝජ්‍ය අධ්‍යක්ෂ G.A. STUDENIKI විසින් එම සමාගමේ අධ්‍යක්ෂ PEREGUDOVගේ ඇටෝර්නි බලපත්‍රයක් මත ගිවිසුම අත්සන් කර තිබෙනවා. එසේ නමුත් පසුගිය වසර 05 තුළ අදාළ ඇටෝර්නි බලපත්‍රය අධිකරණයට ඉදිරිපත් කිරීමට පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසය කටයුතු කළේ නැහැ. ඒ තුළින් මා කෙරෙහි වැරදි චිත්‍රයක් අධිකරණයට ඉදිරිපත් කළා.

## මිග් යානාවේ නැඟී කළ දේශපාලන දඩයම උදයංග හෙළි කරයි

මිග් ගනුදෙනුවට අදාළ මුල් ලිපිය ඉදිරිපත්ව ඇත්තේ 2006 ජනවාරි 25 වන දිනයි. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ එවක හමුදාපතිවරයා විසින් එවක ආරක්ෂක ලේකම්වරයා වෙත දන්වා ඇත්තේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට මිග් යානා මිලදී ගැනීමේ අවශ්‍යතාවක් ඇති බවත්, ඒ සඳහා අනුමැතිය ලබාදෙන ලෙසත්ය. ඒ අනුව මෙම ගනුදෙනුව සඳහා මුල පුරා ඇත්තේ ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින්ම බවත් අදාළ ගනුදෙනුව මාගේ මූලිකත්වයෙන් අරඹන ලද්දක් නොවන බවත් මෙම ලිපි මඟින් පැහැදිලි වෙනවා.

ඉන්පසුව යුක්‍රේනයේ UKRINMASH නමැති සමාගමෙහි නියෝජිතයකු 2006/02/06 දින ආරක්ෂක අමාත්‍යාංශයේ හා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරීන් මුණ ගැසී ඇති අතර පසුව ලිපියක් මඟින් මිග් ගුවන් යානා හතරක් අලෙවි කිරීම හා තවත් මිග් යානා හතරක් ඕවර්හොල් කිරීම සඳහා වන ලිපියක් ඉදිරිපත් කර ඇති අතර එම ලිපිය මගින් එම සේවා සඳහා ඇමරිකානු ඩොලර් 14,280,000/-ක මිලක් ඉදිරිපත් කර තිබෙනවා. එම ලිපියේ අවසාන පිටුවෙහි සඳහන් කර ඇත්තේ එකී අර්පනය FINANCIAR කෙනෙක් සමඟ එක්ව ඉදිරිපත් කරනු ලබන බවත් එම FINANCIARගේ නම ගිවිසුම අස්සන් කිරීමට දින තුනකට පෙර දැනුම් දෙන බව ගුවන් හමුදාපති වෙත දැනුම් දීමට කටයුතු කරන බවයි. ඒ අනුව එකී FINANCIARගේ මැදිහත්වීම සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශය සහ ගුවන් හමුදාව මුල සිටම දැනුම්වත් කර ඇති බව පෙනී යනවා.

ඉන්පසු ජාතික ප්‍රසම්පාදන ඒජන්සියේ සභාපතිවරයා තාක්ෂනික හා මූල්‍ය ඇගයීම් කමිටුවක් (TEC) ගුවන් හමුදාපතිවරයාගේ සභාපතීත්වයෙන් හා නිලධාරින් හය දෙනෙක්ගෙන් යුත් තාක්ෂණික හා මූල්‍ය ඇගයීම් කමිටුවක් පත් කර තිබෙනවා. ඒ අනුව ගුවන් හමුදාපතිවරයා ප්‍රධාන තාකෂණ ඇගයීම් කමිටුව ස්වකීය නිර්දේශ මඟින් UKRINMASH සමාගමෙන් අදාළ යානා මිල දී ගන්නා ලෙසට ද ගෙවිය යුතු මිල ගණන් දන්වා, ඊට අනුමැතිය දෙන ලෙසට ආරක්ෂක ලේකම්වරයාට දන්වා තිබෙනවා. එසේම ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශයේ ලේකම්වරයා, ආරක්ෂක ලේකම්රයා ඇතුළු නිලධාරීන් තිදෙනකුගෙන් සමන්විත කැබිනට් මණ්ඩලය මඟින් පත් කර තිබූ ප්‍රසම්පාදන කමිටුවක් විසින් තාක්ෂණික ඇගයීම් කමිටුවේ යථෝක්ත නිර්දේශ හා ගුවන් හමුදාපතිවරයාගේ ඉල්ලීම සලකා බැලීමෙන් අනතුරුව ඒ සම්බන්ධයෙන් සිය නිරීක්ෂණ 2006/05/05 දින ඉදිරිපත් කර ඇත. පසුව යානා මිල දී ගැනීම ශ්‍රී ලංකා ගුවන් හමුදාව මඟින් සිදු කර බව ගුවන් හමුදාපතිවරයා ආරක්ෂක ලේකම්වරයා වෙත දන්වනු ලැබ තිබෙනවා. ඒ අනුව ගනුදෙනුවට අදාළ ක්‍රියාපටිපාටිය සිදු කරන ලද්දේ මා විසින් නොවන බව පැහැදිලි සාක්ෂි තිබෙනවා. එහෙත් පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසය දිගින් දිගටම මෙම චෝදනා මට එල්ල කිරීම දේශපාලන පළි ගැනීමක් වෙනවා.

මිග් ගනුදෙනුවට අදාළව 2006/06/09 දින ගුවන් හමුදාපතිවරයා THE LETTER OF GUARANTEE යන ශීර්ෂය සහිත ලිපියක් "UKRINMASH" සමාගමෙහි අධ්‍යක්ෂ PEREGUDOV යන අයට යොමු කර තිබෙනවා. එමගින් ශ්‍රී ලංකා රජයේ ආරක්ෂක අමාත්‍යාංශය වෙනුවෙන් අදාළ යානා මිල දී ගැනීම හා ඕවර්හෝල් කිරීම UKRINMASH හරහා කරවා ගැනීමට අපේක්ෂා කරනු ලබන බවට සහතිකර ඇති බව සඳහන් වෙනවා. ඒ අනුව ඔහු තවදුරටත් දන්වා ඇත්තේ, අදාළ යානා හදිසියේ මිල දී ගැනීමට අවශ්‍යතාව ඇති බැවින් විධිමත් ගිවිසුමක් අස්සන් කිරීමට පෙරම අදාළ යානා ඕවර්හෝල් කිරීමේ කටයුතු අරඹන ලෙසයි. ඒ අනුව ගුවන් හමුදාවේ ඉංජිනේරුවරයකු ඇතුළු ගුවන් හමුදා නිලධාරීන් පිරිසක් යුක්රේනියාවේ අදාළ කර්මාන්ත ශාලාවට සේවය කිරීම සඳහා පිටත් වී ඇති බව ද මෙහි සටහන් වෙනවා. මම යුකේරනයේ ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙස සේවය ආරම්භ කළේ 2006/07/17 සිට මිග් ගනුදෙනුවට අදාළ ගිවිසුමට ශ්‍රී ලංකා රජය 2006 ජූලි 04 දින අස්සන් තබා තිබෙනවා.

මේ අනුව මම රුසියානු සමූහාණ්ඩුවේ ශ්‍රී ලාංකා තානාපතිවරයා ලෙස පත් කරනු ලැබිමට මසකටත් පෙර මෙම මිග් යානා මිල දී ගැනීම හා ඕවර්හෝල් කිරීමට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහමුලින්ම අවසන් වි තිබෙනවා. අදාළ ඕවර්හෝල් කටයුතු අරඹන ලෙස මෙකී UKRINMASH සමාගම වෙත නිල වශයෙන් ගුවන් හමුදාපති විසින් දන්වා අවසන් කොට තිබූ බව පැහැදිලි වෙනවා. එපමණක් නොව ගුවන් හමුදාවේ ඉංජිනේරුවරයකු ඇතුළු ගුවන් හමුදා නිලධාරීන් පිරිසක් මිග්යානා අලුත්වැඩියා කරන කර්මාන්ත ශාලාවට ගිවිසුමට අදාළව සේවය කිරීම සදහා යුක්රේනයේ ලුවෝෆ් නගරයට පිටත් වී ඇති අතර 2006 ජූලි 15 දින ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ඉහත කී BELLIMISSAHOLDINGS සමාගම වෙත ENDUSER සහතිකය දෙකක් නිකුත් කර ඇති බව සනාථ කරන සාක්ෂි තිබෙනවා. එසේම අදාළ ඇණවුම තහවුරු කරමින් 2006/07/15 දින ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ORDER CONFIRMATION එකක් ඉහත කී UKRINMASH සමාගම වෙත යවා ඇති අතර එහි පැහැදිලිව දක්වා ඇත්තේ මෙම ගනුදෙනුවට අදාළ ගෙවීම් BELLIMISSA සමාගම වෙත කරනු ලබන බවයි.

ශ්‍රී ලංකා ගුවන් හමුදාව BELLIMISSA සමාගම සහ UKRINMASH සමාගම අතර ත්‍රෛපාර්ශ්වික ගිවිසුම 2006/07/26 දින ගුවන් හමුදාපතිවරයා විසින් අස්සන් තබනු ලබන්නේ ඉන් අනතුරුවයි. ඉන්පසුව එම ගනුදෙනුවට අදාළ ඉන්වොයිසිය ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ඒවා ඇති අතර ගුවන් හමුදාව විසින් BELLIMISSA සමාගම නමට මහජන බැංකුව හරහා ඩොලර් 13,976,000 වටිනාකමකට ණයවර ලිපියක් නිකුත් කිරීමෙන් බව සඳහන්. ඒ අනුව පැහැදිලි වන්නේ ගිවිසුමට අදාළ මුදල යට කී BELLIMISSA HOLDINGS LTD සමාගම වෙත ගෙවනු ලබන්නේ ශ්‍රී ලංකා ගුවන් හමුදාපතිවරයාගේ සම්පූර්ණ අනුදැනුම මත බවයි.

**රෝෂන් තුෂාර**

ඉතිරි කොටස හෙට පත්‍රයේ

(මිග් යානයේ ඡායාරූපය නිරූපණයක් පමණි)

